# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1386/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 27/08/2024 පැය 1220

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.08.26 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 43 | - | |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුර**

2024.08.26 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුරේ නිලධාරීන් විසින් මොරටුව පොලිස් වසමේ මොරටුවැල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 370 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මොරටුව පොලිස් ස්ථානය භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වූ මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි

**03. නිධන් සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුර**

2024.08.26 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුරේ නිලධාරීන් විසින් තිස්සමහාරාම පොලිස් වසමේ තිස්සමහාරාම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **නිධන් සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් සිව් දෙනෙකු** අත්අඩංගුවට ගෙන තිස්සමහාරාම පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 40 හා 61 අතර වයස්වල පසුවන සූරියවැව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

තිස්සමහාරාම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. නීති විරෝධීව වගා කරන ලද ගංජා හේනක් වටලා සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර**

2024.08.26 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන් විසින් තණමල්විල පොලිස් වසමේ ඌරුහොර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **නීති විරෝධීව වගා කරන ලද ගංජා හේනක් වටලා ගංජා ගස් 5712 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තණමල්විල පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ ඌරුහොර ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි

**05. බලපත්‍ර නොමැතිව කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර**

2024.08.26 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන් විසින් පස්සර පොලිස් වසමේ දෙල්ගොල්ල ඇල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන පස්සර පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 38 හා 56 අතර වයස්වල පසුවන පස්සර ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පස්සර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි

**06. බලපත්‍ර නොමැතිව සිප්පිකටු කුඩුකර ලොරි රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර**

2024.08.26 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් විසින් මොරවැව පොලිස් වසමේ බොරලු කන්ද ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව සිප්පිකටු කුඩුකර කිලෝ 50 බැගින් අඩංගු උර 500 ක් ලොරි රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන මොරවැව පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 හා 46 වයස්වල පසුවන කින්නියා 06 හා පුලියන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මොරවැව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**